මගේ අංකය :- 2/පාස/4/72.
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය' - බත්තරමුල්ල.
1995.02.21 වන දින.

අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංකය : 95/4

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු වෙත.

## පස්වැන්නේ ශිෂ්‍යත්ව විභාගය - 1995 සිට

මෙතෙක් අගෝස්තු මාසය තුළ පැවැත්වූ පස්වැන්නේ ශිෂ්‍යත්ව විභාගය මෙවර පවත්වනු ලබන්නේ දෙසැම්බර් මස මුල සතියේ අ.පො.ස. (සා.පෙළ) විභාගය ආරම්භ කරන දිනට පෙර දිනය. විභාගය පවත්වනු ලබන දිනය මෙසේ කල් දැමීමට හේතුවූයේ මෙම වර්ෂයේ සිට ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍ර නව ආරකට පිළියෙල කරන නියා, ඒ අනුව සූදානම් වීමට විභාග දෙපාර්තමේන්තුවට හා පාසල්වලට ප්‍රමාණවත් කාලයක් දීම අවශ්‍ය නිසාය.

**විභාග පටිපාටිය**

එක් දිනක් තුළ පැවැත්වෙන මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1 වැනි ප්‍රශ්න පත්‍රය
පෙරවරු 9.30 සිට පෙරවරු 10.15 දක්වා (විනාඩි 45 යි)
සිසුන්ගේ ඉගෙනීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා සුදුසු අන්දමේ ප්‍රශ්න මෙම පත්‍රයට ඇතුළත් කෙරේ.

2 වැනි ප්‍රශ්න පත්‍රය
පෙ.ව. 10.45 සිට ප.ව. 12.00 දක්වා (පැය 1 යි විනාඩි 15 යි)
1 වසර සිට 5 වසර දක්වා වූ සමස්ත ප්‍රාථමික විෂය මාලාව ඇසුරු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ.
ශිෂ්‍යත්ව විභාගයට අදාල ආදර්ශ ප්‍රශ්න පත්‍ර විභාග දෙපාර්තමේන්තුව විසින්
සකස්කළ විෂය පාසල්වල දැනගැනීම සඳහා නිකුත් කරනු ඇත.
මෙම ශිෂ්‍යත්ව පරීක්ෂණයේදී සෑම ශිෂ්‍යයෙකුම ලබාගන්නා ලකුණු ඔවුන් වෙත දන්වා යවනු ඇත.

2 පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍ර සකස් කිරීමේ ආර සහ අන්තර්ගතය වෙනස්වන නිසා ළමුන් පෞද්ගලික උපකාරක පන්තිවලට යවමින් දැඩි පීඩනයකට පත්කිරීම අවශ්‍ය නොවනු ඇත. එසේම, මෙතෙක් පැවති ආකාරයට විෂයයන් දෙකකට පමණක් අවධානය යොමු නොකොට 1 වසර සිට පස්වන වසර දක්වා සමස්ත ප්‍රාථමික විෂය මාලාවෙම කරුණු ළමුන්ට ඉගැන්වෙන ආකාරයට ප්‍රාථමික අංශයේ ඉගැන්වීමේ කටයුතු සංවිධානය කළ යුතුය.

මෙම චක්‍ර ලේඛයේ අඩංගු කරුණු හැකි ඉක්මනින් සියලුම විදුහල්පතිවරුනට, කලාපීය/කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට/ගුරු උපදේශකවරුන්ට දැන ගැනීමට සැලැස්විය යුතුය.

චක්‍රලේඛය ලද බව මා වෙත දන්වා එවන්න.

එම්. ඩී. ඩී. පීරිස්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම්..

පිටපත්

1 විභාග කොමසාරිස් ජෙනරාල් - අ.ක.ස.
2 අධ්‍යක්ෂ ජෙනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය - අ.ක.ස.
3 සභාපති, ජාතික අධ්‍යාපන කොමිසම - අ.ක.ස.
4 කලාපීය/ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු - අ.ක.ය.